පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ICT

හත්වන සතිය

ශ්‍රේණිය - 6

සැකසුම - M.B.R.T.D. සෙනවිරත්න

පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න

- ❖ ගැටලුවක් විසඳීම සඳහා ඇතුලත් කරන දේ .................................. ලෙස හඳුන්වයි.
- ❖ ගැටලුවක් විසඳීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය .................................. ලෙස හඳුන්වයි.
- ❖ ගැටලුවක් විසඳීම සඳහා අනුගමනය කරන පියවර සියල්ල පිළිවෙලින් දැක්වීම .................................. ලෙස හඳුන්වයි.
- ❖ ඇල්ගොරිදමයක පියවර රූපමය ආකාරයෙන් ඉදිරිපත් කිරීමට .................................. යොදා ගනියි.

(ප්‍රතිදානය /ඇල්ගොරිතමය /ගැලීම් සටහන් / ආදානය)

(2) කේක් එකක් පිළියෙල කිරීමට අදාල ආදානය , ක්‍රියාවලිය හා ප්‍රතිදානය ලියා දක්වන්න.

(3) කේක් එකක් පිළියෙල කිරීමට අදාල ඇල්ගොරිදමය ලියා ඊට අදාල ගැලීම් සටහනද ඇඳ දක්වන්න.

(4) පහත සඳහන් ක්ෂේත්‍ර වල පරිගණකය භාවිතා වන අවස්ථා දෙක බැගින් ලියන්න.

- ❖ පාසල් ක්ෂේත්‍රය තුල
- ❖ රෝහල් ක්ෂේත්‍රය තුල
- ❖ ගොවිපළ ක්ෂේත්‍රය තුල
- ❖ බැංකු ක්ෂේත්‍රය තුල

(5) පරිගණක විද්‍යාගාරය තුල ඔබ විසින් අනුගමනය කල යුතු යහපත් පුරුදු මොනවාද ?

(6) පහත රූප සටහනේ සිටින පුද්ගලයා විසින් පරිගණකය භාවිතයේදී අනුගමනය කරන නිවැරදි ඉරියව් 4 ක් ලියා දක්වන්න.




(7) පරිගණකය භාවිතයේදී නිවැරදි ඉරියව් අනුගමනය නොකිරීමෙන් ඔබට ඇති විය හැකි රෝගී තත්වයන් මොනවාද?

(8) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා භාවිත කරන 3R සංකල්පය පැහැදිලි කරන්න.

(9) ශක්තිමත් මුරපදයක ලක්ෂණ 2 ක් ලියන්න.

(10) ශක්තිමත් මුරපද සඳහා උදාහරණ 5 ක් ලියන්න.